**ශීර්ෂය 176 - සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---------------------------------------------------------

**1.1 විගණන විෂය පථය**

සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 18 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(I) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.15,320,225,497 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.14,888,444,055 ක්

උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.431,781,442 ක් හෙවත් සියයට 3 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 141,201,195 | 133,075,129 | 8,126,066 | 6 |
| මූලධන | 15,179,024,302 | 14,755,368,926 | 423,655,376 | 3 |
| එකතුව | 15,320,225,497 | 14,888,444,055 | 431,781,442 | 3 |

**(II) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 84 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

- අයවැය සහාය සේවා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ ලබාගත් රු.29,550,000ක් වූ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් සියයට 65 ක ප්‍රමාණයක් උපයෝජනය කර තිබුණි.

**(ආ) ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය විසින් 2013 වර්ෂය සඳහා ආදායම් සංකේත 20.03.02.08 සඳහා එකතුව රු.මිලියන 2,652 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.මිලියන 2,784ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 105 ක ආදායමක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2013 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | ඉක්මවීම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 20.03.02.08 | 2,652,000,000 | 2,783,782,985 | 131,782,985 | 5 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ ආදායම් ගිණුම සම්බන්ධව අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 142(3) ප්‍රකාරව පොත්පත් පවත්වා නොතිබුණි. අමාත්‍යාංශය විසින් සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් මාසයකට දෙවතාවක් ලබා ගන්නා ආදායම් විස්තර උපයෝගී කරගෙන ආදායම් ගිණුම පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ii) 2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 03 ජේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකථනය හා ඇස්තමේන්තු කිරීම් නිවැරදි පදනමක් මත ගණනය කර පිළියෙල කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු පිළියෙල කිරීමට අදාල තොරතුරු අනුව 2013 පෙබරවාරි සිට ජුලි දක්වා මාස 6ක ආදායම දෙගුණයක් කර සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව පිළියෙල කර තිබුණි. ආදායමෙහි වෙනස්වීම් අනුව මුදල් රෙගුලාසි 85(2)(ආ) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර සංශෝධිත ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 17601 | 2,500,000 | 1,561,251 | 1,700,000 | 1,831,652 | 14,000,000 | 7,818,840 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වර්ෂ 04කට ආසන්න කාලයක සිට හිඟව පැවති සේවය අත්හිටවූ නිලධාරීන් තිදෙනෙකුගේ එකතුව රු.376,426 ක් වූ ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.4 අනුකූල නොවීම්

### නීති ,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිති,රීති හා රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| | XX පරිච්ඡේදයේ 11.1 වගන්තිය | 725,834 | විදෙස් චාරිකා දෙකකට සහභාගි වූ නිලධාරීන් දෙදෙනෙකුට පිරිමැසුම් පන්තියේ ගුවන් ටිකට්පත් වෙනුවට ව්‍යාපාරික පන්තියේ ගුවන් ටිකට්පත් ලබා ගෙන තිබුණි. |
| **(ආ)** | **මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ** | | |
| | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන චක්‍රලේඛයේ 6(i) ඡේදය | 1,292,488 | විදෙස් චාරිකා දෙකක් සඳහා සහභාගි වූ නිලධාරීන් සිව් දෙනෙක් සඳහා නවාතැන් පහසුකම් අදාල විදේශ ආයතනය මගින් සපයා තිබියදී එම |

| | | |
|---|---|---|
| | | නිලධාරීන් හට සංයුක්ත දීමනා ගෙවා තිබුණි. |
| **(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2000 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන චක්‍රලේඛයේ 2 ඡේදය හා 2011 නොවැම්බර් 15 දිනැති අංක 01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපිය | 139,434 | අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරි හට රාජකාරි අවශ්‍යතා සඳහා නිවාස හා ජංගම දුරකථන සඳහා දීමනා ගෙවා තිබියදී, කළමණාකරන සහකාර සේවයේ 1 වන පන්තියේ නිලධාරීන් තිදෙනෙක් අතරින් එක් නිලධාරිණියකට පමණක් චක්‍රලේඛ විධි විධානවලට පටහැනිව විධිමත් අනුමැතියකින් තොරව නිවාස හා ජංගම දුරකථන ගාස්තු 2011 වර්ෂයේ සිට 2014 අගෝස්තු දක්වා ගෙවා තිබුණි. |

## 1.5 කාර්යසාධනය

2013 වර්ෂය සඳහා අමාත්‍යාංශය පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අදාලව කාර්තුමය වශයෙන් හා වර්ෂය අවසානයේ මූල්‍යමය හා භෞතික ප්‍රගතිය දැක්වෙන ප්‍රගති වාර්තා අමාත්‍යාංශය විසින් පිළියෙල කර නොතිබුණි. මේ නිසා අමාත්‍යාංශයේ කාර්යයන්වල ප්‍රගතිය විගණනයේ දී පරීක්ෂා කිරිමට නොහැකි විය.

## 1.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතබේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශයේ 2012 - 2016 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරිමේ කාර්ය සඳහා එම විෂයෙහි වගකීම් පැවරි ඇති සහකාර අධ්‍යක්ෂ (සැලැසුම්) තනතුර දරන නිලධාරිනියක් අමාත්‍යාංශයේ සේවයේ යෙදි සිටියදී එම කාර්යය වෙනත් ආයතනයකට පවරා ඒ සඳහා රු.225,000 ක මුදලක් 2012 හා 2013 වර්ෂවලදී එම ආයතනයට ගෙවා තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාශයේ සහභාගි වූ උත්සවයක මාධ්‍ය ආවරණ කටයුතු සඳහා අමාත්‍යාංශය විසින් රු.62,500 ක් වැයකර තිබුණි

(ඇ) ගරු අමාත්‍යතුමා සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේ පවත්වනු ලබන රැස්වීම්වල සංග්‍රහ කටයුතු වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.16,797 ක් වැය කර තිබුණි.

(ඈ) හම්බන්තොට මත්තල නව ගුවන්තොටුපල පරිශ්‍රයේ හෝටලයක් ඉදිකිරිම සඳහා මුල්ගල තැබීමේ උත්සවය පිළිබඳ පුවත්පත් දැන්වීම් පළකිරිම වෙනුවෙන් වියදම් දැරීමට අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගම එකඟ වී තිබුණත්, එම මුදල එම සමාගමෙන් ලබා ගැනීමෙන් තොරව අමාත්‍යාංශය විසින් ඒ සඳහා රු.230,160 ක් වැය කර තිබුණි.

## 1.7 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| (I) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 09 | - |
| (II) | තෘතියික මට්ටම | 02 | 02 | - |
| (III) | ද්විතියික | 40 | 37 | 03 |
| (IV) | තෘතියික | 21 | 15 | 06 |
| (V) | අනියම් | 05 | 05 | - |
| | **එකතුව** | **77** | **68** | **09** |

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 09ක් පිරිවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

### (ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

ගුවන් සේවා සමාගමකින් ලසු ලේඛිකාවක් හා ගුවන් තොටුපල සේවා සහායිකාවක් පිළිවෙලින් වර්ෂ 03 ක් හා වර්ෂ 05 ක කාලයක සිට අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා යොදවා ගෙන තිබුණි.